සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 63 S I,II

නම: ..........................................

## ව්‍යවසායකත්ව අධ්‍යනය

කාලය පැය තුනයි

1. ව්‍යවසායකත්වය යන්න වඩාත් හොඳින් අර්ථ දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
   1. පෞරුෂ ගුණාංගයකි
   2. දැනුම පමණක් පදනම් වූවකි
   3. මිනිස් චින්තනය හා බැඳුනකි
   4. මිනිස් හැසිරීම තුළින් පිළිඹිබු වන්නකි

2. ප්‍රධාන නිෂ්පාදන සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. ප්‍රාග්ධනය , ශ්‍රමය, භූමිය
   2. භූමිය, සම්පත්, ප්‍රාග්ධනය
   3. මානව සම්පත්, භූමිය, ගොඩනැගිලි
   4. ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, සම්පත්

3. විවිධත්වය ග්‍රහනය කර ගැනීම යනු.
   1. නම්‍යශීලීත්වයට බාධාකාරී වන සාධකයකි
   2. නවෝත්පාදනයට බාධාකාරී වන සාධකයකි
   3. අවදානම් භාර ගැනීමට උපකාරී වන සාධකයකි
   4. නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට බලපාන සාධකයකි

4. "ජෙසිකා කොක් " නැමැති ගුවන් නියමුවරිය තුළ පැවති ප්‍රධානම ව්‍යවසායකත්ව ගතිලක්ෂණය වන්නේ .
   1. තොරතුරු සොයා බැලීමට කටයුතු කිරීම
   2. සාමාන්‍ය වැටහීමකින් යුතුව කටයුතු කිරීම
   3. අසීරු අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කිරීම
   4. ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බව විශ්වාස කිරීම

5. මාළු බෙදාහැරීමේ ජංගම රථ ක්‍රමයට ම බේකරි නිෂ්පාදිත බෙදාහැරීම අයත් වන්නේ.
   1. නවෝත්පාදනයට ය 2. අනුකරණය කිරීමකට ය 3. නව සොයා ගැනීමකට ය 4. අනපේක්ෂිත සිදුවීමකට ය

6. නවෝත්පාදනයක් වෙළඳපොලේ සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට ඇති ඉඩකඩ හඳුන්වන්නේ.
   1. අවදානම ලෙස ය
   3. අවිනිශ්චිතතාවය ලෙස ය
   2. අසාර්ථකත්වය ලෙස ය
   4. අනපේක්ෂිත සිදුවීමක් ලෙස ය

7. වුවමනා වල ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. සීමිතයි, පොදුයි, ප්‍රාථමිකයි
   2. ප්‍රාථමිකයි, විවිධයි, අසීමිතයි
   3. ද්විතිකයි, අසීමිතයි, විවිධයි
   4. ද්විතිකයි, නිර්මණය කළ හැකිය, සීමිතයි

8. ව්‍යවසායකත්වයේ දැකිය හැකි සුවිශේෂී ගතිලක්ෂණයකි.
   1. වැඩි ලාභයක් ලැබීම
   2. ඉහල අවදානමක් දැරීම
   3. නව නිෂ්පාදිත බිහි කිරීම
   4. වැඩි සම්පත් ප්‍රමාණයක් භාවිතයට ගැනීම

9. ව්‍යවසායකත්වයේ මූලික අරමුණ විය යුත්තේ.
   1. තම යහපත මෙන්ම සමාජයේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම
   2. සෑම විටම සමාජයට යහපතක් වන අයුරින් කටයුතු කිරීම
   3. තම ජීවිතය උසස් මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම
   4. පවතින සම්පත් භාවිත කරමින් ලාභය වැඩි කර ගැනීමට කටයුතු කිරීම

10. ආර්ථික කටයුත්තක් වීම යනු.
    1. ව්‍යාපාරිකයාගේ ගතිලක්ෂණයකි
    2. ව්‍යවසායකයාගේ ගතිලක්ෂණයකි
    3. ව්‍යාපාර වල දැකිය හැකි ගතිලක්ෂණයකි
    4. තරඟකරුවන් තුළ දැකිය හැකි ගතිලක්ෂණයකි

11. ගුණත්ව සම්මානය දිනාගත් රජයේ ආයතන වල ප්‍රධානීන් අයත් වන්නේ.
    1. ව්‍යාපාර ව්‍යවසායකයින්ට ය
    2. ආයතනික ව්‍යවසායකයින්ට ය
    3. සමාජීය ව්‍යවසායකයින්ට ය
    4. නිර්මාණශීලි ව්‍යවසායකයින්ට ය

12. නව වෙළඳපොළවල් සොයා යාම.
1. ව්‍යවසායකයාගේ ගතිලක්ෂණයකි
2. ව්‍යාපාරිකයාගේ ගතිලක්ෂණයකි
3. සමාජීය ව්‍යවසායකයාගේ ගතිලක්ෂණයකි
4. නිර්මාණශීලී ව්‍යාපාරියකයාගේ ගතිලක්ෂණයකි

13. ව්‍යාපාරයකට පාලනය කළ හැකි පරිසර සාධක ඇතුළත් වන්නේ.
1. අභ්‍යන්තර පරිසරයට ය
2. ආසන්න පරිසරයට ය
3. බාහිර පරිසරයට ය
4. ගෝලීය පරිසරයට ය

14. නවෝත්පාදනයක් බිහි කිරීම සඳහා ව්‍යවසායකයකු තුළ පැවතිය යුතු මූලික ගතිලක්ෂණය වන්නේ.
1. නම්‍යශීලීත්වයයි
2. නිර්මාණශීලීත්වයයි
3. ස්වයං පෙළඹවීමයි
4. ස්වාධීනත්වයයි

15. ව්‍යවසායකත්වයේ දැකිය හැකි සුවිශේෂීම වැදගත්කම වන්නේ.
1. ඉහළ ප්‍රතිලාභ ලැබීම
2. නව නිෂ්පාදිත බිහි කිරීම
3. ඉහළ අවදානමක් දැරීම
4. උපරිම මට්ටමින් සම්පත් භාවිතා කරීම

16. වර්තමානයේ ප්‍රචලිත වෙමින් පවතින "විද්‍යුත් ගෙවීම්" ක්‍රම හැඳින්විය හැක්කේ.
1. අනුකරණයක් ලෙස ය
2. සංකලනයක් ලෙස ය
3. දිගුවක් ලෙස ය
4. උපකරණයක් ලෙස ය

17 ව්‍යවසායකයකු තමාගේ අරමුණු කරා ස්වයං පාලනයකින් යුතුව ළඟා වීමට කටයුතු කරයි මෙය හඳුන්වන්නේ.
1. සුභවාදී වීම ලෙස ය
2. නම්‍යශීලීත්වය ලෙස ය
3. ස්වාධීනත්වය ලෙස ය
4. නිර්මාණශීලීත්ව ය ලෙසය

18. ශ්‍රී ලංකාවේ පවතින ස්වාභාවික සම්පත් බහුලව භාවිතා වන ව්‍යාපාරයකි.
1. සංචාරක ව්‍යාපාරය
2. ඛණිජ තෙල් නිෂ්පාදන ව්‍යාපාරය
3. ඇඟළුම් නිෂ්පාදන ව්‍යාපාරය
4. ස්වර්ණාභරණ නිෂ්පාදන ව්‍යාපාරය

19. සඳුන් සෑමවිටම නම්‍යශීලී සැලසුම් ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක කරයි. මෙය සඳුන්ගේ ව්‍යාපාරයට.
1. ශක්තියකි
2. අවස්ථාවකි
3. යහපතකි
4. තර්ජනයකි

20. කුඩා පරිමාණ ව්‍යාපාර සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී වැඩි වශයෙන් අවදානය යොමු කරනු ලබන්නේ.
1. දේශීය සම්පත් හා දැනුම කෙරෙහිය
2. තරඟකාරීත්වයේ ස්වරූපය කෙරෙහිය
3. රජයෙන් ලබා දෙන දිරි ගැන්වීම් කෙරෙහිය
4. සම්පත් ලබා ගැනීමේ පහසුව කෙරෙහිය

21. ප්‍රසන්න සහල් නිෂ්පාදන ව්‍යාපාරයක හිමිකරුවකි ඔහුගේ ව්‍යාපාරයට බලපාන අභ්‍යයන්තර පරිසර සාධකයක් වන්නේ.
1. සහල් ආනයනය සීමා කිරීම
2. නියඟය නිසා වී අස්වැන්න පහළ යාම
3. වී ගොවීන්ට පොහොර සහනාධාරයක් ලබා දීම
4. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් නොමැති වීම

22. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කෙරෙහි දැඩිලෙස බලපා ඇති දේශපාලන හා නෛතික පරිසර සාධකයක් වන්නේ.
1. උද්ධමනය ඉහළ යාම
2. පොලී අනුපාත ඉහළ යාම
3. බදු අනුපාතය ඉහළ යාම
4. සේවා වියුක්තිය ඉහළ යාම

23. නිර්මාංශ පාරිභෝගිකයන් වෙනුවෙන් ම සොසේජස් වර්ගයක් වෙළඳපොළට හඳුන්වා දීමට ජනිදු අදහස් කරයි. මෙහි දී ජනිදු වැඩි අවදානයක් යොමු කර ඇත්තේ
1. ආර්ථික පරිසරයටයි
2. තාක්ෂණික පරිසරයටයි
3. ස්වාභාවික පරිසරයටයි
4. සමාජ හා සංස්කෘතික පරිසරයටයි

24. වර්තමානයේ බොහෝ වාපාර තම නිෂ්පාදිත පාරිභෝගික ඇණවුම් මත නිවසටම ගෙන ගොස් අලෙවි කරයි. මෙය අයත් වන්නේ
1. අලෙවි අංශයට යි
2. බෙදාහැරීමේ අංශයට යි
3. සිල්ලර වෙළඳ අංශයට යි
4. තෘතික අංශයට යි

25. ව්‍යවසායකයෝ රැකියා අවස්ථා බිහි කරති. මෙය අයත් වන්නේ ව්‍යවසායකත්වයේ.
1. ආර්ථික මට්ටමේ ප්‍රතිලාභ ගණයටය
2. සමාජීය මට්ටමේ ප්‍රතිලාභ ගණයටය
3. ජාතික මට්ටමේ ප්‍රතිලාභ ගණයටය
4. ග්‍රාමීය මට්ටමේ ප්‍රතිලාභ ගණයටය

26. ව්‍යවසායකයකු විසින් සිය ව්‍යාපාරයේ පවතින දුර්වලතා හඳුනාගනු ලබන්නේ.
1. ආර්ථික පරිසරය අධ්‍යනය කිරීම මඟිනි
2. ප්‍රජා පරිසරය අධ්‍යනය කිරීම මඟිනි
3. දේශපාලන පරිසරය අධ්‍යනය කිරීම මඟිනි
4. අභ්‍යන්තර පරිසරය අධ්‍යනය කිරීම මඟිනි

27. ප්‍රාථමික අංශයට අයත් වන ව්‍යාපාර ක්ෂේත්‍රයකි.
1. රක්ෂණ ආයතන
2. සිල්ලර වෙළඳසැල්
3. මිරිදිය මසුන් ඇල්ලීමේ ව්‍යාපාර
4. පාලම් බෝක්කු ඉදි කිරීමේ ව්‍යාපාර

28. විදේශ විනිමය අනුපාතය වෙනස් කිරීම අයත්වන ව්‍යාපාර පරිසර සාධකයක් වනනේ.
1. ආර්ථික පරිසරය
2. තාක්‍ෂණික පරිසරය
3. දේශපාලන පරිසරය
4. ගෝලීය පරිසරය

29. ආසන්න පරිසර සාධකයකි.
1. තරඟකරුවන්
2. අයිතිකරුවන්
3. සේවකයින්
4. කළමණාකරුවන්

30. කාබණික පොහොර නිෂ්පාදන ව්‍යාපාරයක දැකිය හැකි ශක්තියකි.
1. ගොවීන් අතර කාබණික පොහොර භාවිතය වැඩි වීම
2. කාබණික පොහොර ආනයනය කිරීමට එරෙහිව සීමා පැනවීම
3. රජය විසින් කාබණික පොහොර භාවිතයට ගොවීන් දිරි ගැන්වීම
4. දැනුම හා පුහුණුව සහිත සේවක පිරිසක් සිටීම

31. ව්‍යවසායකත්ව කාර්යයේ නිරත වීමේ දී ව්‍යවසායකයකුට මුහුණ දීමට සිදුවන අභියෝග හඳුනා ගැනීමට ඇති හැකියාව හඳුන්වන්නේ.
1. සංකල්පනාත්මක කුසලතාවයක් ලෙස ය
2. තාක්‍ෂණික කුසලතාවයක් ලෙස ය
3. සන්නිවේදන කුසලතාවයක් ලෙස ය
4. කණ්ඩායම් සමඟ කටයුතු කිරීමේ කුසලතාවයක් ලෙස ය

32. ව්‍යාපාරයකට ඇති තරඟකාරීත්වය වැඩිවීම සැලකිය හැක්කේ.
1. අවස්ථාවක් ලෙස ය
2. ශක්තියක් ලෙස ය
3. දුර්වලතාවයක් ලෙස ය
4. තර්ජණයක් ලෙස ය

33. වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ප්‍රධාන ලක්‍ෂණයක් වන්නේ.
1. ලාභය ප්‍රධාන අරමුණ වීම
2. පාරිභෝගිකයන් බලවත් වීම
3. අවශ්‍යතා හා වුවමනා සරල වීම
4. භාණ්ඩ හා සේවා දුලබ වීම

34. අනපේක්ෂිත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බිහි වූවකි.
1. ග්‍රැමෆෝනය
2. ගුවන්යානය
3. විදුලි බල්බය
4. විශ්‍රාමික නිවාස

35. ව්‍යවසායකයින් සාර්ථක වීමට පෙර මුහුණ දීමට සිදුවී ඇති අසාර්ථකත්වයන් සලකන්නේ.
1. බිඳ වැටීමක් ලෙස ය
2. අත්දැකීමක් ලෙස ය
3. අභියෝගයක් ලෙස ය
4. අනපේක්ෂිත සිදුවීමක් ලෙස ය

36. සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා.
1. ව්‍යාපාර ව්‍යවසායකයෙකි
2. නම්‍යශීලී ව්‍යවසායකයෙකි
3. ආයතනික ව්‍යවසායකයෙකි
4. තරඟකාරී ව්‍යවසායකයෙකි

37. නිවැරදි අරුතක් ගෙන දෙන ප්‍රකාශය තෝරන්න.
1. අවශ්‍යතා මතු වූ පසු වුවමනා ඇති වේ
2. වුවමනා පුද්ගල උප්පත්තියත් සමඟ ඇති වේ
3. පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා විවිධ වේ
4. වුවමනාවන් සියලු දෙනාටම පොදුවේ

38. ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම මගින්,
1. මිනිසුන්ගේ ජීවන තත්වය පහළයාමක් සිදු වේ
2. මිනිසුන්ගේ ජීවන රටාවේ පහළ යාමක් සිදු වේ
3. රටේ අදායම වැඩි පිරිසක් අතර බෙදී යාමක් සිදු වේ
4. රටේ අදායම් ඉපයීම සීඝ්‍රයෙන් ඉහළ යාමක් සිදු වේ

39. සකස් කරන ලද සැලැස්මට අනුව කටයුතු සිදුවනවා දැයි සොයා බැලීම සිදු කරන්නේ.
1. නායකයාගේ භූමිකාව යටතේය
2. සේවකයාගේ භූමිකාව යටතේය
3. ව්‍යවසායකයාගේ භූමිකාව යටතේය
4. කළමණාකරුගේ භූමිකාව යටතේය

40. තමා තමාගේ ම ස්වාමියා ලෙස සැලැකීම, අයත් වන ව්‍යවසායකත්ව ගති ලක්‍ෂණය වන්නේ.
1. කැපවීමයි
2. ආත්ම විශ්වාසයයි
3. සාමාන්‍ය වැටහීමයි
4. ස්වයං පෙළඹීමයි

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



## II පත්‍රය

උපදෙස්

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද සෙසු ප්‍රශ්න සඳහා ලකුණ 10 බැගින්ද හිමි වේ.

1. පහත සඳහන් සිද්ධිය හොඳින් කියවා අංක i සිට x දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

දසුන් චාමර වෙනස් වන පරිසරයට අනුව වෙනස් වීමට කැමති, දැරියහැකි අවදානම් පමණක් භාර ගනිමින් වෙනස් දෙයක් දෙයක් කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයෙකි.

මිනිසුන්ගේ කාර්ය බහුල ජීවිතය නිසා පෝෂ්‍යදායි ආහාර වේලක් සකස් කර ගැනීමට ඇති දුෂ්කරතාවය දසුන් විසින් හඳුනා ගෙන ඇත. මෙම ගැටලුකාරී තත්වයට විසඳුම් ලබාදීමට දසුන් අදහස් කරයි. ඒ සඳහා කාබණික පොහොර යොදා වගා කරන අමුද්‍රව්‍ය භාවිත කර ලැබෙන ඇණවුම් වලට අනුව සකසන ලද ආහාර නිවෙස්වලට ම බෙදාහැරීමට අදහස් කරයි. මුලින්ම ඔහුගේ ඉලක්ක වෙළඳපල ලෙස ඔහු ජීවත්වන කුරුණෑගල නගර සීමාව තෝරා ගැනීමට තීරණය කර ඇත .

ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා කුරුණෑගල නගරයට ආසන්නයේ පිහිටි තම පියා සතු ගොඩනැගිල්ල සහ දසුන් විසින් එකතු කරගෙන ඇති රු 500.000 ක මුදල ද යෙදවීමට අදහස් කර ඇත. මීට අමතරව ආහාර සැකසීම සඳහා පුහුණු සේවකයින් පස් දෙනෙකු සහ සැකසූ ආහාර බෙදාහැරීම සඳහා සේවකයින් තුන්දෙනෙකු ද යොදවා ගැනීමට අදහස් කරයි .

i. දසුන් සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** ලියන්න .
ii. දසුන්ගේ නවෝත්පාදනය සඳහා පදනම් වූ මූලාශ්‍රය ලියන්න .
iii. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි නිෂ්පාදන සාධක **දෙකක්** නම් කර ඒ සඳහා සිද්ධියේ සඳහන් නිදසුන බැගින් ලියන්න.
iv. මෙම සිද්ධියේ සඳහන් වන භාණ්ඩය හා සේවාව සඳහන් කරන්න.
v. සිද්ධියේ සඳහන් වන දසුන් විසින් සපුරාලනු ලබන අවශ්‍යතාවය ලියන්න.
vi. දසුන්ගේ ව්‍යාපාරය අයත් වන ව්‍යවසායකත්ව වර්ගය ලියන්න.
vii. දසුන්ගේ ව්‍යාපාරයෙන් ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.
viii. දසුන්ගේ ව්‍යාපාරය තුළ දැකිය හැකි කුඩා පරිමාණ ව්‍යාපාර වල ලක්ෂණ **දෙකක්** ලියන්න.
ix. සිද්ධියේ සඳහන් අභ්‍යන්තර පරිසර සාධකයක් සහ බාහිර පරිසර සාධකයක් බැගින් ලියන්න.
x. දසුන්ගේ ව්‍යාපාරය තුළ දැකිය හැකි ශක්තීන් **දෙකක්** ලියන්න .

(ලකුණු 2 x 10 = 20 යි)

2. I. ව්‍යවසායකයකුගේ නිර්මාණශීලිත්වයට බාධාකාරී වන සාධක **හතරක්** ලියන්න.
ii. ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධකය සඳහා නිදසුන් **හතරක්** ලියන්න .
iii. ව්‍යවසායකයකුගේ නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න.
iv. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර **දෙකක්** ලියන්න.
v. ව්‍යවසායකත්ව සංකල්පය ව්‍යාපාරික දෘෂ්ටිකෝණයෙන් පැහැදිලි කරන්න .

(ලකුණු 2 x 5 = 10 යි)

3. i. මිනිසා විසින් සපුරා ගත යුතු අවශ්‍යතා **හතරක්** ලියන්න.
   ii. අවශ්‍යතා හා වුවමනා අතර දැකිය හැකි වෙනස්කම් **දෙකක්** ලියන්න.
   iii. ව්‍යාපාර වල දැකිය හැකි ගති ලක්ෂණ **හතරක්** ලියන්න.
   iv. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර ඇති සමානකම් **දෙකක්** ලියන්න.
   v. ආයතනික ව්‍යවසායකයා යනු කවරෙක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 x 5 = 10 යි)

4. I. ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ **හතරක්** ලියන්න.
   ii. ව්‍යවසායකයකුට සමාජ සුභ සාධනයට දායක විය හැකි ක්‍රම **හතරක්** ලියන්න .
   iii. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න.
   iv. ව්‍යාපාර ව්‍යවසායකයින් සඳහා නිදසුන් **දෙකක්** ලියන්න .
   v. ව්‍යාපාරයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න .

(ලකුණු 2 x 5 = 10 යි)

5. i. ව්‍යවසායකත්ව කාර්යයේ නියැලීම තුළින් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ **හතරක්** ලියන්න.
   ii. ව්‍යාපාරයට බලපෑම් එල්ල කරන ආසන්න පරිසර සාධක **හතරක්** ලියන්න .
   iii. කුඩා පරිමාණ ව්‍යාපාර වල දැකිය හැකි ගති ලක්ෂණ **හතරක්** ලියන්න .
   iv. ආර්ථික සංවර්ධනයට කුඩා පරිමාණ ව්‍යාපාර දායක වන ක්‍රම **දෙකක්** ලියන්න .
   v. කුඩා පරිමාණ ව්‍යාපාර යන්න කෙටියෙන් පැහැදිලි කරන්න .

(ලකුණු 2 x 5 = 10 යි)

6. I. ව්‍යවසායකයෙකු විසින් වර්ධනය කර ගත යුතු කුසලතා **හතරක්** ලියන්න.
   ii. ව්‍යවසායකයකු නායකත්ව භූමිකාවේ කටයුතු කරන විට ඉටු කරනු ලබන කාර්යයන් **දෙකක්** ලියන්න.
   iii. කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි සීමා **හතරක්** ලියන්න.
   iv. කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න .
   v. නිර්මාණශීලීත්වය යන ව්‍යවසායකත්ව ගුණාංගය කෙටියෙන් පැහැදිලි කරන්න .

(ලකුණු 2 x 5 = 10 යි)

7. i. නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ලක්ෂණ **හතරක්** ලියන්න .
   ii. ආර්ථික පරිසරය තුළ ක්‍රියාත්මක වන සාධක **හතරක්** ලියන්න .
   iii. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ **දෙකක්** නම් කරන්න.
   iv. ව්‍යවසායකයකුට ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් අත් කර ගත හැකි ප්‍රයෝජන **දෙකක්** ලියන්න.
   v. ව්‍යාපාර පරිසරය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 x 5 = 10 යි)